www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 19: සන්ධි

## I පත්‍රය

01. දී ඇති සන්ධි පදවල සන්ධි වර්ගය දක්වා ඇති වරණය තෝරන්න.

මහේසිකා, ගමනාගමනය, ඉන්නල, දොම්පෙ

(1). ස්වරාදේශ, පූර්වස්වර ලෝප, ද්විත්වරූප, ගාත්‍රාදේශ
(2). ආගම, ද්විත්වරූප, ස්වර, පරස්වර ලෝප
(3). ස්වරාදේශ, පූර්වස්වර ලෝප, ද්විත්ව රූප, ගාත්‍රාදේශ
(4). ගාත්‍රාදේශ, පූර්වස්වර ලෝප, ද්විත්ව රූප, ආගම

02. විභාගාපේක්ෂකයා, අත්‍යවශ්‍ය, පුනරාගමනය, නෙළුම්මල් යන පද සියල්ලම නිවැරදි ව විසන්ධි කර ඇති වරණය වන්නේ,

(1). විභාග + අපේක්ෂකයා, අත්‍ය + වශ්‍ය, පුන + ආගමනය, නෙළු + මල්
(2). විභාග + අපේක්ෂකයා, අති + අවශ්‍ය, පුනර් + ආගමනය, නෙළුම් + මල්
(3). විභාගා + අපේක්ෂකයා, අත්‍ය + අවශ්‍ය, පුනර් + ආගමනය, නෙළුම් + මල්
(4). විභාග + අපේක්ෂකයා, අති + අවශ්‍ය, පුන + ආගමනය, නෙළුම් + මල්

03. දී ඇති සියලුම පද නිවැරදිව විසන්ධි කර නැති පද පේළිය තෝරන්න.

(1). රිය + ඇදුරු, සු + උස්මෙන්, මත් + ඇති, ති + අයුණු
(2). කොස් + අතු, මෙ + අත, සිතු + කම්, සග + වැල්ල
(3). වප් + කඩ, ගඟ + රන්, පුන + උත්, රුක් + අත්තන
(4). උක්කා + බ්‍යාත, මොළොක් + අතින්, දොඹ + පේ, කොසු + අ

- **අංක 04 සිට 08 තෙක් එක් එක් ප්‍රශ්නයේ මුලින් දී ඇති පදයේ නිවැරදි විසන්ධි විග්‍රහය තෝරන්න.**

04. අත්‍යලංකාර

(1). අති + අලංකාර (2). අත්‍ය + අලංකාර (3). අත් + අලංකාර (4). අත්‍ය + ලංකාර

05. මන්දෝත්සාහී

(1). මන්ද + උත්සාහය
(2). මන්දෝ + ආ + උත්සාහය
(3). මන්ද + අ + සාහය
(4). මන්ද + උත්සාහී

06. පංචේන්ද්‍රිය

(1). පංච + ඊ + ඉන්ද්‍රිය
(2). පංචා + අන්ද්‍රිය
(3). පංච + ඉන්ද්‍රිය
(4). පංච + අ + ඉන්ද්‍රිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

07. ඔවුනොවුන්

(1). ඔවුන් + ඔවුන්
(3). ඔ + උනත්
(2). ඔවුන් + නො + ඔවුන්
(4). ඔවුන් + උනුන්

08. දෑඟිලි

(1). දෑ + ඇඟිලි
(2). දෙ + ඇඟිලි
(3). දෙන් + ඇඟිලි
(4). දෑ + ඇඟිලි

09. සූර්ය + උදය, දෙ + ඇස, කටු + අල, අභි + අවකාශ යන පද නිවැරදි ලෙස සන්ධි කර ඇති වරණය තෝරන්න.

(1). සූර්යෝදය, දෙඇස, කටුඅල, අභ්‍යවකාශ
(3). සූර්යෝදය, දෑස, කටුවල, අභ්‍යවකාශ
(2). සූර්යෝදය, දෑස, කටු අල, අභ්‍යවකාශ
(4). සූර්යෑදය, දෑස, කටුවල, අභ්‍යවකාශ

10. රිද්ම + අනුකූල යන පද දෙක එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1). රිද්මනුකූල
(3). රිද්මානුකූල
(2). රිද්මයානුකූල
(4). රිද්මයානුකූල

## II පත්‍රය

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. ස්වරයක් මුල්ව සෑදෙන සන්ධි කීයද? ඒ මොනවාද?

02. ව්‍යඤ්ජනාක්ෂරයක් මුල්ව සෑදෙන සන්ධි විධි කීයද? ඒ මොනවාද?

03. පහත පද සන්ධි කරන්න.

(i). භාෂා + අනුරාගය
(vii). වන + ඖෂධ
(ii). ගුරු + උපදේශ
(viii). විද්‍යා + අනුකූල
(iii). ක්‍රිස්තු + උත්පත්තිය
(ix). ගොක් + අත්ත
(iv). ශ්‍රවණ + ඉන්ද්‍රිය
(x). පංච + ඉන්ද්‍රිය
(v). ගුරු + අක්ෂර
(xi). පූජා + උත්සව
(vi). ප්‍රථම + ආධාර
(xii). පීතෘ + අර්ථ

04. පහත පද සන්ධි පද විසන්ධි කොට සන්ධි නාමය ද ලියන්න.

(i). කම්මුල
(vii). බැතින්
(ii). පොත්තල්මාරිය
(viii). මුදලිඳු
(iii). හෙළයෝ
(ix). යන්නෝනෑ
(iv). වළංදෙක
(x). ගුර්වක්ෂර
(v). වටොර
(xi). පර්යේෂණ
(vi). පන්සිල්
(xii). අතීන්ද්‍රිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!